# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

**6 ශ්‍රේණිය** | **නර්තනය** | **ඒකකය : 11 - වන්නම්**

- **පහත දී ඇති වාක්‍ය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන තුළ යොදන්න.**

(1) උඩරට හනුමා වන්නම මාත්‍රා දෙකේ තාල රූපයට නර්තනය කරනු ලැබේ. (    )

(2) උඩරට හනුමා වන්නම මාත්‍රා තුනේ තාල රූපයට අනුව ගායනය කරනු ලැබේ. (    )

(3) උඩරට හනුමා වන්නම මාත්‍රා 4 තාල රූපය මත ගොඩනැගී ඇත. (    )

(4) උඩරට හනුමා වන්නම වඳුරෙකුගේ ගති පැවතුම් තේමා කරගෙන රචනා කර ඇත. (    )

- **ප්‍රශ්න අංක 05 සිට 18 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(5) වන්නම් අයත් වන්නේ කුමන නැටුම් වර්ගයට ද?
1) ජන නැටුම් 2) ගැමි නැටුම් 3) ශාස්ත්‍රීය නැටුම් 4) ගෝත්‍රික නැටුම්

(6) වන්නමකින් සිදු කෙරෙන්නේ,
1) ගුණ ගායනයකි. 2) සෙත් පැතීමකි. 3) වර්ණනාවකි. 4) ආශිර්වාද කිරීමකි.

(7) වන්නම් නර්තනය,
1) ඒකල නර්තන ක්‍රමයකි.
2) සමූහ නර්තන ක්‍රමයකි.
3) යුගල නර්තන ක්‍රමයකි.
4) ඒකල / යුගල / සමූහ වශයෙන් නර්තනය කළ හැකිය.

(8) උඩරට සාම්ප්‍රදායික වන්නම් සංඛ්‍යාව,
1) 18 කි. 2) 32 කි. 3) 21 කි. 4) 24 කි.

(9) උඩරට වන්නම් රචනා කරන ලද්දේ කුමන යුගයකදී ද?
1) මහනුවර 2) කෝට්ටේ 3) අනුරාධපුර 4) පොළොන්නරුව

(10) උඩරට, පහතරට, සබරගමු වන්නම් නර්තනයේ දී යොදා ගන්නේ කුමන චලන වර්ගය ද?
1) සංචාරී චලන 2) ප්‍රකාශනාත්මක චලන
3) රිද්මයානුකූල චලන 4) තාලානුකූල චලන

(11) උඩරට හනුමා වන්නම ගැයෙන තාල රූපය කුමක් ද?
1) සුළු තනි තිත 2) මැදුම් තනි තිත
3) මහ තනි තිත 4) සුළු මැදුම් දෙතිත

(12) උඩරට හනුමා වන්නමට අයත් බෙර පදය කුමක් ද?
1) ජිං ගත ගොගො 2) කුඳ ගත ගත දොම්
3) දොං ජිංත ගත දොංත 4) දොං දොං ජිං ජිං ගජිගත



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(13) හනුමා වන්නමෙන් කියැවෙන්නේ කුමන සතෙකුගේ හැසිරීම් රටාව ද?
1) ලේනා 2) සිංහයා 3) ඇතා 4) වඳුරා

(14) උඩරට වන්නමේ ගායනා කොටස් නටා අවසන් කරන්නේ කුමකින් ද?
1) කස්තිරම් නැටීමෙනි. 2) අලංකාර පද නැටීමෙනි.
3) තානම ගායනා කිරීමෙනි. 4) මාත්‍රයක් නැටීමෙනි.

(15) උඩරට සහ සබරගමු වන්නම් නර්තනයේ ප්‍රධාන අරමුණ වන්නේ කුමක් ද?
1) සෙත් පැතීමයි. 2) විනෝදාස්වාදයයි.
3) දක්ෂතා ප්‍රදර්ශනය කිරීමයි. 4) දෙවියන්ට පුද පූජා කිරීමයි.

(16) පහතරට සාම්ප්‍රදායික වන්නම් සංඛ්‍යාව කොපමණ ද?
1) 18 කි. 2) 32 කි. 3) 21 කි. 4) 24 කි.

(17) සබරගමු සාම්ප්‍රදායික වන්නම් සංඛ්‍යාව කොපමණ ද?
1) 18 කි. 2) 32 කි. 3) 21 කි. 4) 24 කි.

(18) වන්නමක කිසිඳු අර්ථයක් දක්නට නොලැබෙන නාද මාලාව පමණක් ගැයෙන වන්නමක මුලට යෙදෙන වචන කොටස කුමන නමකින් හඳුන්වයි ද?
1) කස්තිරම 2) බෙර පදය 3) තානම 4) කවි

- **කෙටි පිළිතුරු සපයන්න.**

(19) හනුමා වන්නමේ තාල රූපය නම් කරන්න.
(20) හනුමා වන්නමේ බෙර පදය නම් කරන්න.
(21) හනුමා වන්නමේ තානම ලියන්න.
(22) හනුමා වන්නමේ කවියක් ලියන්න.
(23) හනුමා වන්නමේ කස්තිරම ලියන්න.
(24) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් වන්නම් 03 ක් නම් කරන්න.
(25) වන්නම් ගායනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු 02 ක් ලියන්න.
(26) වන්නම් නර්තනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු 02 ක් ලියන්න.

**සැකසුම : නවමල් ජයවීර මයා**

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk



agaram.lk